චීනයේ හමුදා කුමන්ත්‍රණයක් සිදුවූ බවට ආරංචි පැතිර ගිය සමයක චීන කොමියුනිස්ට් පක්ශය සිය 20 වෙනි සම්මේලනය පැවැත්වීමට සූදානමින් පසුවෙයි.  ඔක්තෝම්බර් හෝ නොවැම්බර් මාස වල මිට පෙර ද පැවති මෙම සම්මේලනය සඳහා රටපුරා තෝරා ගත් කොමියුනිස්ට් පක්ශ සාමාජිකයන් 2300 කට ආසන්න පිරිසක් කැඳවනු ලබයි. පලාත් මට්ටමින් ඉහල නිලධාරීන්,හමුදා නිලධාරීන්,විවිධ වෘත්තිකයන්ගෙන් සැදුම්ලත් මෙම පිරිසෙන් හතරෙන් එකක පමණ ප්‍රමාණයක කාන්තා නියෝජනයකින් ද යුක්තවේ.




Xi Jin Pin
Image Source- www.ebay.com

මේ වන විට 69 වන වියෙහි පසුවන ෂී ජින් පින් සිය තෙවන ධූර කාලය සඳහා තරග කිරීමට අපේක්ෂාවෙන් සිටින අතර ඔහු විසින් පක්ශ ප්‍රඥප්ති සහ ආන්ඩුක්‍රම ව්‍යවස්ථාව ද ඒ සඳහා බාධා නොමැතිවන ලෙස සංශෝධනය කර ඇත.

2007 වසරේ දේශපාලන මණ්ඩලයේ ස්ථාවර කාරක සභාවට පත්වූ ෂී අවසන් වරට පැවති පක්ශ සම්මේලනයේ දී නවක දේශපාලකයන් එම කමිටුවට පත් නොකිරීමද ඔහුගේ දිගු කාලීනව බලයේ සිටීමේ අරමුණේම කොටසක් විය හැකිය. ෂී මහජන චීන සමූහාන්ඩුවේ බලවත්ම දේශපාලනඥයා ලෙසද සැලකෙන අතර  මා ඕ සේතුංගේ කාලයේ හෝ එක් පුද්ගලයෙක් වටා මෙතරම් බලයක් කේන්ද්‍රගතව තිබී නැත.

මේ වනවිට චින ආර්ථිකයද යම් පසුබෑමක ඇති රටට ඇතුල්වීමට ඇති දැඩි සීමා නිසා සමූහ ප්‍රතිශක්තිය ද වර්ධනය වී නොමැත. මෙම ප්‍රතිපත්තිය ජාත්‍යන්තරය සමග ගනුදෙනු කිරීමේදී ද ගැටලු ඇතිකර තිබේ. උයිගුර් මුස්ලිම් ප්‍රජාවට සලකන ආකාරය, තායිවාන සහ හොංකොං සමග ඇති ගැටලු වලදී ෂී කටයුතු කල ආකාරය නිසා අනුකම්පා විරහිත නායකයෙක් ලෙස ෂී ප්‍රසිද්ධියට පත්ව ඇත. ඔහු යටතේ මර්දනය තීව්‍ර වනු ඇතැයි මානව  හිමිකම් ක්‍රියාකාරීහුද අනාවැකි පල කරති.

ඉදිරි සම්මේලනයේ දී විදේශ සහ ආර්ථික ප්‍රතිපත්ති වෙනුවට නායකත්වයේ අනාගත සංයුතිය මත පදනම්ව පාලනය මෙහෙයවනු ලබන ආකාරය වැඩි වශයෙන් සාකච්ඡාවට ගනු ලැබෙනු ඇතැයි වාර්තා වේ.
කෙසේ වුවත් ෂී ජින් පින් සහ ඔහුගේ මිතුරන් අත දිගටම බලය පවතිනු ඇතැයි අනුමාන කල හැකිය.